**දමන ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දමන ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතු ගිණුම් දෙකකට අදාළව ස්ථාවර තැන්පතු වටිනාකම රු.24,071 ක් හා පොළී ආදායම රු.47,417 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ සිට අදාළ වර්ෂයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාලව ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.185,917 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 ආදායමට බැරකර ඇති බව. | -එම- |
| (ඇ) | ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ PT 1 සහ PT 1 2nd 50% යටතේ ගෘහස්ත කුකුළු කූඩු සකස් කිරීම හා පැටව් ලබාදීම අදියර - 01 සහ අදියර 02 සඳහා වන රු.6,000,000 ක් වටිනා ව්‍යාපෘති යෝජනා අනුමත නොවී තිබිය දී කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි ලෙස ගිණුම්ගතකර තිබුණි. | එම මුදල ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | දමන අලහේන ක්‍රීඩාංගනය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර බිලපත් නිරවුල් කිරීම පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය හරහා සිදුකර තිබිය දී ප්‍රාදේශීය සභාව විසින් එම ව්‍යාපෘතියේ වටිනාකම රු.4,645,470 ක් කර්මාන්ත ණයහිමි හා කර්මාන්ත ණයගැති ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද හෙළගම්පුර කොම්පෝස්ට් අංගනයේ විදුලි වැඩ සම්බන්ධ ව්‍යාපෘතියේ වටිනාකම රු.295,589 ක් ප්‍රාග්ධනික කර නොතිබුණි. | 2023 ජුනි 30 දිනට ප්‍රාග්ධනිත කර ඇති බව. | -එම- |
| (ඊ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (PT 1) යටතේ උපකරණ සහ වැඩිදියුණු කළ පද්ධති සහිත ඉදිරිපස කාර්යාලවල පුරවැසියන් සඳහා පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.930,826 ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.2,859,183 ක් වූ ගිණුම් විෂයන් 09 කට අදාළව උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛන ශේෂ සනාථ කිරීම් හා වරිපනම් ලේඛන යනාදි ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 2016 වර්ෂයේ සිට වරිපනම් ලේඛනය පරිගණකගතව පවත්වාගෙන යනු ලබන අතර වර්ෂයේ ලැබීම් තුලනය කරනු ලැබේ. 2010 හෝ ඊට පෙර සිට පවතින ශේෂ 08කට අදාළ තොරතුරු කිසිවක් නැත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,344,297 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,365,078 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් බැංකු සැසඳුම් ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට බැංකුවේ වැරදි ලෙස සටහන් කර ඇති රු.150,000 ක මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බැංකුව සමඟ සාකච්ඡා කළද නිවැරදි කර නොදුන් අතර සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත අදාළ ලේඛන යොමුකර ඇති අතර අනුමැතිය ලද වහාම නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 720,907 | 815,706 | 494,264 | 1,799,725 | 770,907 | 719,307 | 876,493 | 1,478,283 |
| ii. | කුලී ආදායම | 3,585,000 | 1,914,501 | 854,593 | 1,876,723 | 4,099,000 | 3,152,914 | 3,056,516 | 816,814 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,020,000 | 446,850 | 446,850 | 83,750 | 1,693,000 | 1,282,450 | 1,282,450 | 83,750 |
| iv. | වෙනත් ආදායම් | 2,970,400 | 2,544,562 | 2,544,562 | - | 5,165,500 | 3,993,117 | 3,329,337 | 663,780 |
| v. | එකතුව | 8,296,307 | 5,721,619 | 4,340,269 | 3,760,198 | 11,728,407 | 9,147,788 | 8,544,796 | 3,042,627 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.1,568,875 ක් විය. | ආදායම් පරිපාලක තනතුරු 03 ක් වසරකට අධික කාලයක සිට පුරප්පාඩුව පවතී. එහෙයින් නියමිත දිනට අදාළ කටයුතු සිදුකළ නොහැකි වුවද දැනට තාවකාලිකව පත්කරන ලද ආදායම් පරිපාලක මඟින් අවශ්‍ය කටයුතු ඉටුකිරීමට කටයුතු කරන බව. | පනතේ විධි විධාන අනුව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී ශේෂය රු.1,701,919 ක් වූ අතර හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආදායම් පරිපාලකවරුන් නොමැති වීම හේතුවෙන් ආදායම් එකතු කිරීමේ කටයුතු හා නීත්‍යානුකූල කටයුතු කිරීමේ අපහසුතා ඇත. දැනට තාවකාලිකව පත්කරන ලද ආදායම් පරිපාලක මඟින් අවශ්‍ය කටයුතු ඉටුකිරීමට කටයුතු කරන බව. | ගිවිසුම් අනුව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා විසින් 2022 මැයි 09 වන දින සභාවේ කැබ් රථයෙන් රැස්වීමකට සහභාගී වී ආපසු පැමිණීමේ දී කලහකාරී සිද්ධියට මැදි වී කැබ් රථයට පහර දී ගිනි තැබීම හේතුවෙන් කැබ් රථය මුළුමනින්ම හානියට පත් වී තිබූ අතර මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ඉදිරිපත් කළ ප්‍රාරම්භක වාර්තාව අනුව රථයට සිදුව තිබූ අලාභය රු.8,500,000 ක් වුවත් රක්ෂණ වන්දි ලෙස ලද මුදල රු.5,000,000 ක් වූයෙන් ප්‍රාදේශීය සභාවට රු.3,500,000 ක අලාභයක් සිදු වී තිබුණි. | පිළිගන්නා බව. කැබ් රථය අවසන් වරට 2017 වර්ෂයේ තක්සේරු කර ඇති බැවින් රක්ෂණ සහතික ලබාගෙන ඇත්තේ එම වටිනාකම අනුව බව. | විමර්ශනයක් පවත්වා අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ පුනරාවර්තන - 2021 වැඩසටහන යටතේ දමන ප්‍රාදේශීය සභාව වෙත මිලදීගෙන තිබූ වීථි ලාම්පු උපකරණවලින් රු.48,400 ක් වටිනා 7/0.53 වයර් රෝල් 05 ක් ගබඩාව වෙත ලැබී නොතිබිය දී තොග ලේඛනවල ඇතුළත් කර ගෙවීම් කිරීම හේතුවෙන් ප්‍රාදේශීය සභාවට රු.48,400 ක අලාභයක් සිදු වී තිබුණි. | ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව. | අලාභය අයකර ගැනීමට හා අභ්‍යන්තර පාලන පිළිවෙත් විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ PT 1 සහ PT 1 $2^{nd}$ 50 යටතේ ප්‍රාදේශීය සභාවේ සහ හිඟුරාණ සති පොළෙහි පුනර්ජනනීය බලශක්ති පද්ධති 02 ක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘති 02 ක් සඳහා රු.6,000,000 ක ප්‍රතිපාදන අනුමත වී තිබුණි. 2021 වර්ෂයේ සහ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කළ යුතුව පැවති මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගැටලු මතුවීම හේතුවෙන් නවතා දමා ඒ වෙනුවට ගෘහස්ථ කුකුල් කූඩු සකස් කිරීමට හා කුකුල් පැටව් ලබාදීමේ ව්‍යාපෘති 02 ක් සඳහා 2022 නොවැම්බර් සිට අනුමැතිය ඉල්ලා තිබුණ ද 2023 ජුනි 08 විගණිත දින වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි. මේ අනුව | අදාළ ව්‍යාපෘතියට රු.3,000,000 බැගින් රු.6,000,000 ක මුදලක් කුකුල් පාලනයට අනුමැතියට යවා ඇති බැවින් අනුමැතිය ලැබුණු වහාම ව්‍යාපෘතිය ඉටුකළ හැකි බව දන්වමි. | ප්‍රාදේශීය සභා මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර නියමිත කාලය තුළ ව්‍යාපෘති සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශීය සභා මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති යෝජනා සකස් කර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය සභාව වෙත වෙන් වූ රු.6,000,000 ක ප්‍රතිපාදන වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ආ) | සභාව සතු කඩ කාමර 43 ක ගිවිසුම් විධිමත් නොවන බව නිරීක්ෂණය වූ අතර වලංගු ගිවිසුම් රහිතව කඩ කාමර කුලියට ලබාදීම තුළ කඩකාමර අයිතිය පිළිබඳ ගැටලු, අතුරු බදු දීම් පිළිබඳ ගැටලු සහ හිඟ මුදල් අයකර ගැනීමේ ගැටලු පැන නැගිය හැකි බැවින් ගිවිසුම් යාවත්කාලීන කිරීම කෙරෙහි කඩිනම් අවධානය යොමුවිය යුතුව පැවතුණි. | ගිවිසුම්වල පවතින අඩුපාඩු හැකි ඉක්මණින් නිවැරදි කිරීමටත් ගැටලු නිරාකරණය කිරීමටත් ඉදිරියේ දී කටයුතු කරන බව. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෙලගම්පුර ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානයේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කැපීම සඳහා පළාත් විශේෂ සංවර්ධන ආධාර යටතේ මිලදී ගත් රු.490,000 ක් වටිනා යන්ත්‍රයක් තෙකලා විදුලි සම්බන්ධතාවයක් නොමැතිව වර්ෂ 04 ක් සභාවේ කාර්යාල ගබඩා කාමරයේ නිෂ්කාර්යව පැවැතුණි. | තෙකලා විදුලි සැපයුම ලබාදෙන ලෙස ඉල්ලීම්කර ඇත නමුත් හෙළගම්පුර එම මාර්ගය නිවාස නොමැති මාර්ගයක් වන අතර විදුලි සැපයුම ලබාගෙන ඇත්තේ කොම්පෝස්ට් අංගනයට පමණක් බව. | විදුලි සැපයුම ලබාගෙන යන්ත්‍රය භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම, සුසාන භූමි 27 ක හා ක්‍රීඩා පිටි 10 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරුවක් කර නොමැති බැවින් වටිනාකම හඳුනාගැනීමට නොහැකි බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාව සතු පහත සඳහන් මෝටර් රථ හා කරත්ත අයිතම 05 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම පිළිබඳ කිසිඳු ලේඛනයක් සභාව සතුව නැති බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සභාව සතුව පවතින භාවිත කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 10 ක් වසර 04 සිට වසර 20 දක්වා කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | මේ සම්බන්ධව කටයුතු සොයාබලා සුදුසු පරිදි කටයුතු කරන බව. | භාවිතා කළ නොහැකි වාහන වෙන්දේසි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව භාරයේ පවතින වාහන 09 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- | වාහන අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 16 ක් පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය වූ අතර එම පුරප්පාඩු සම්පූර්ණ නොවීම හේතුවෙන් කාර්යාල කටයුතු පවත්වාගෙන යාමේ ගැටලු මතු වී තිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත මාසිකව දැනුවත් කරනු ලැබේ. ඇතැම් පුරප්පාඩු බහුකාර්ය සංවර්ධන සහායක හා නව සංවර්ධන නිලධාරී බඳවාගැනීම් මඟින් පුරවා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |